# අදීසි

ජගත් ජේ එදිරිසිංහ ලියයි

වැව් දිය තලාවට ඔබ්බෙන් ඇදී යන අන්ධකාර වළා පෙළ අතරින් අව් රැල්ලක් වැටෙයි. කුඩා දැළකින් මාලු අල්ලමින් වැවේ ඈත කෙළවරේ සිටින මිනිසා දැන් වඩාත් හොඳින් පෙනෙයි.

වැහි වළාව ඉක්මණින්ම ඈතට ඇදී යාම පිලිබඳව සුනන්ද සිටියේ සතුටකිනි. දිනයට නියමිත් වැඩ ප්‍රමාණය වැස්ස නිසාවෙන් ප්‍රමාද වනු දකින්නට ඔහු අකමැතිව සිටියේ




ය. මේ වැඩ බිමේ බැඳෙන සෑම ගඩොලක් ගඩොලක් පාසාම සිය ජීවිතය වෙනස් වන බවක් ඔහුට දැනෙයි. මේ වෙනස්වීම හැකි තාක් ඉක්මණින් සිදුවනු දැකීම ඔහුගේ අභිප්‍රායයි. දැනටමත් පමා වූවා වැඩි ය.

අලුත් ගොඩනැගිලි අතරින් ඇවිද යමින් සිටින ඔහුට ගේ සිතට සතුටක් දැනෙයි. ප්‍රධාන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් නිමවෙමින් ඇත. එයට සමගාමීව ඉදිවෙමින් පවතින පරිවාර ගොඩනැගිලි අතර අලුත් වන වගාවක්ද දැනටම අරඹා ඇත. ඉදිකිරීම් අවසන මේ ගොඩනැගිලි සියල්ල විසල් ගස් හා ගල් අතර සැඟව ගොස් මේ ස්වභාවික පරිසරයේම කොටසක් වනු ඇති බව නිසැක ය. ජීවිතයේ පළමු වතාවට හරයක් ඇති යමකට ශක්තිය වන්නට හැකි වීම පිළිබඳ සිතේ ඇති වූ ආත්ම තෘප්තිය සියලු දුක්ඛ දෝමනස්ස බොහෝ ඈතට පන්නා දැමුවාක් මෙනි.

"අපායත් දිව්‍ය ලෝකයත් දෙකම තියෙන්නෙ අපේ හිත් ඇතුලෙමයි මහත්තයා.." පොඩි හාමුදුරුවන් ගේ වදන් සුනන්දට සිහි වෙයි. ඒ සමගින්ම සිහියට එන්නේ පන්සලේ දී අවසන් වරට හමුවූ අයෝමා ගේ රුවයි. ඇය තමාගේ ජීවිතයට කොයි තරම් ආගන්තුක චරිතයක් බවට පත්ව ඇත්ද යන්න දැනෙන විට සිතට ඇතිවන්නේ පුදුමයකි.

සියල්ල යම්කිසි නියමයකට අනුව සිදුවෙමින් තිබෙයි. මැදහත් සිතින් මේ වෙනස් වීම් දෙස බලා සිටින්නට ඔහුට ඇවැසි ය.

"වෙනස් වෙනකල් බලාගෙන ඉන්න බැහැ සහෝදරයා.. අපි මැදිහත් වෙලා වෙනස් කරන්න ඕනෙ.." බණ්ඩාර සුනන්දට කීවේ වත්තේ දී ඊයේ සවස හමුවූ වේලාවේ දී ය. ඒ කතා කළේ සමාජය ගැන ය. "... අපි සන්ධානෙකට යනවා තමයි.. ඒත් එහෙම කරන්නෙ අතීතයෙ සම්ප්‍රදායික වම කළා වගේ තනතුරු වරප්‍රසාද අපේක්ෂාවෙන් නෙවෙයි.. සියල්ල වෙනස් කිරීමේ අවංක බලාපොරොත්තුවෙන්.."

"වෙනස් කරන්න ඉඩ දෙයි ද..?" සුනන්ද ඇසුවේ සුපුරුදු නිවුණ ස්වරයෙනි.

"ඉඩ දෙනකල් ඉන්න බැහැ සුනන්දයියා.. අපි ඉඩ ගන්න ඕනෙ.. ඉඩක් ලැබෙන්නැත්නං අපි එළියට බහින්නත් ලෑස්තියි.."

"සමහරවිට ඒක තමයි මල්ලිලාට කරන්න වෙන්නෙ.."

"මොකද්ද..?"

"එළියට බහින එක.."

වාහනයක් හෝටල් බිමට ඇතුල් වනු දෙවන මහලේ කවුලුවෙන් බලා සිටින සුනන්දට පෙනෙයි. පළමුව එයින් බසින්නේ වින්ධ්‍යා ය. ඒ සමගම වාගේ පසුපස අසුණේ සිට බසින මැදි වයසේ යුවළ එක වර හඳුනාගන්නට සුනන්දට නොහැකි ය. සුනන්ද වහා පහත මාලයට බසින්නේ කුතුහලය පිරුණ සිතිනි. යම්කිසි විශේෂිත හේතුවක් නොවේ නම් වින්ධ්‍යා මේ හදිසියේ මෙහි නොපැමිණෙනු ඇත.

"අයේෂගෙ අම්මයි තාත්තයි අපේ ගෙදර ආවා.. ඔයා මුණ ගැහෙන්න කියලා.." වින්ධ්‍යා සුනන්දට ඈත තියාම කියයි.

නන්දාවතී හා සුරවීර දැන් සුනන්දට හඳුනාගත හැකි ය. තමන්ට කීප අවස්ථාවකදීම රණසිංහ ගේ කාර්යාලයේදී ඔවුන් හමුවූ බවත් ඔහුට මතක ය.

"හදිසියෙම..?" සුනන්ද ප්‍රශ්නය අසන්නේ සුරවීරගෙනි.

"අයේෂ දවස් ගාණකින් ගෙදර ආවෙ නැහැ මහත්තය.." සුරවීර අපැහැදිළි හඬින් කියයි. ඔහුගේ දෑස් තුළ එක්ව ඇති කඳුළු සුනන්දගෙන් සැඟවිය නොහැකි ය.

"අපි පොලිසියටත් කිව්ව.." නන්දාවතී සාරි පොටින් ඇස් පිසදා ගනියි.

"මාව හමුවෙන්න ආවෙ..?"

"කියන්න කෙනෙක් නැහැ මහත්තය.. හැමෝටම කිව්ව.. රණසිංහ මහත්තයටත් කිව්ව.. වැඩක් නැහැ.. කාටවත් වගේ වගක් නැහැ.. අපට මේ වෙලාවෙ උදව්වක් ඉල්ලන්න පුලුවන් එකම එක්කෙනා සුනන්ද මහත්තයා විතරයි.."

"කෙල්ල දවස් ගාණක් අහස පොළොව ගැටලන්න වගේ කල්පනා කර කර ඉන්නවා මං දැක්කා මැඩම්.. අනේ මගේ අහිංසක කෙල්ල.. මං ඒත් ඇහුවා.. ඡන්දෙ නිසා වැඩ වැඩියි.. මහන්සියි කියල තමයි මට කිව්වෙ"

"අයේෂගෙ අම්මයි තාත්තයි අද මෙහෙ එනව කියල රණසිංහ මහත්තය දන්නව ද..?" සුනන්ද තාවකාලික කාර්යාලයේ පුටුවක වාඩි වන්නේ නන්දාවතීටත් සුරවීරටත් වාඩි වන ලෙස සන් කරමින් ය. වින්ධ්‍යා ශීතකරණයෙන් ගත් සිසිල් බීමක් වීදුරු තුනකට දමා ඔවුනට පිලිගන්වයි.

"අපි කිව්වෙ නැහැ මහත්තය.. " නන්දාවතී අතට ගත් වීදුරුව දෙස බලාගත්වන ම කියයි. "මොකටද කියන්නෙ..? තමං ළඟ වැඩ කළ කෙල්ල ගැන රණසිංහ මහත්තය මෙයිට වඩා උනන්දු වෙලා හොයයි කියලා අපි බලාපොරොත්තු වුණා.. එක්කො එයාට ඡන්ද වැඩ නිසා මෙලෝ සිහියක් නැහැ.. එහෙමත් නැත්නං අපේ කෙල්ලට හෙණ ගැහුණත් එයාට කමක් නැහැ.."

"මෙහෙම කිව්වට තරහ ගන්න එපා මැඩම්... ඇත්තම කිව්වොත් දැන් අපිට ඔය කවුරු ගැනවත් විශ්වාසයක් නැහැ.. ඒ හින්දයි සුනන්ද මහත්තය මුණගැහෙන්න මේ තරම් දුරක් ගෙවාගෙන ආවෙ.." සුරවීර ගේ කටහඬ වෙවුළන්නේ ආවේගය නිසා ය. සුනන්දට එය වැටහෙයි.

තමන් අවසන් වරට අයේෂා හමුවූ අවස්ථාව සුනන්දට තවම මතකය. ඒ මොහොතේ ඈ සිටියේ යම්කිසි කළකිරීමක් සිතේ පුරවාගෙන බව සුනන්දට මතක ය. සැමදා ඇගෙන් දිස් වූ ප්‍රබෝධමත් බව එදා ඈ වෙතින් පලා ගොස් තිබුණා නොවේ ද? තමාගෙන් සඟවාගත් යමක් ඇගේ සිතෙහි වූ බවට ඒ මොහොතේ දී ත් ඔහුට සැක සිතුණි. ඇගෙන් ඒ පිලිබඳව නෑසුවේ තමන්ට අදාල නොවන කිසිවක් හාරා අවුස්සා ඇසීමේ පුරුද්දක් ඔහුට නැති බැවිනි. එසේ වුව ද තමා ඇගෙන් ඒ පිලිබඳව අසා බැලිය යුතුව තිබුණා නොවේදැයි දැන් ඔහුට සිතෙයි.

"අයේෂ ගෙදර ආවෙ නැහැයි කියල කිව්වම රණසිංහ මහත්තය මොකද කිව්වෙ..?"

"මොනා කියන්නද? හොයල බලන්නං කිව්ව.. සල්ලි කොල වගයක් දික් කළා.. මං බැලුවෙවත් නෑ... මගෙ බල්ලටවත් එපා ඒ සල්ලි.. ඡන්දෙ ඉවරවෙනකල් කලබල නොකර ඉන්ඩයි කිව්ව... එච්චර තමයි.. "

සුනන්ද නැගිට ජනේලය වෙත යයි. ජනෙල් කවුළුවට දෑත් තබා ඈත අහස දෙස බලා සිටියි. වැහි ලිහිණියන් යයි අනුමාණ කළ හැකි කුරුල්ලන් කීපදෙනෙකු බොහෝ ඈත අහසේ පියාසළනු ඔහුට පෙනෙයි. අරමුණකින් තොරව බොහෝ වේලාවක් ඒ කලු තිත් කීපය දෙස බලා සිටින සුනන්ද අපසු හැරෙයි. සුරවීරගේ පීඩාවෙන් බර වූ මුහුණ දෙස එක එල්ලේ බලා සිටින සුනන්ද කටහඬ අවදි කරයි.

"මං දන්නෑ මට කරන්න පුලුවන් දෙයක් තියෙනවද කියල .. ඒත් මං හෙට කොළඹ එන්නං.. ආවාම බලමු අපට මොනාද කරන්න පුලුවන් කියල .."

000000000

**මෙවන් කාලයක සුනන්ද ළඟ නොසිටීමේ අවාසිය ඔහුට දැන් වඩාත් දැනෙයි. එහෙයියෙක් නොවී තමාට කෙළින් උපදෙසක් දෙන්නට තරම් ශක්තියක් තිබූ එකම පුද්ගලයා අවශ්‍යම වේලාවේදී තමා හැර ගොස් තිබීම අභාග්‍යයකි. අතීතයේදී තමා කරදරයට පත් වූ සෑම තැනකදීම තමා ආවරණය කරගත් ආරක්ෂා කරගත් හිතවතා ගේ නික්ම යාම රණසිංහ ගේ සිතේ දැන් දැන් දැඩි වේදනාවක් ඇති කරයි. ඒ අඩුව පුරවන්නට අජිත්ට නොහැකි ය. සුනන්ද නම් වන නිහඬ මිනිසා තුළ තිබූ ගැඹුර අජිත් තුළ නැත.**

"මං තමුසෙලාට සිංහලෙන් කිව්වනෙ ඕනෙ නැති කුණ්ඩවාල දාගන්න එපා කියලා.. දැන් බලනවා වෙච්ච දේ.." පිසසෝම ගේ කෝපාන්විත කඩහඬ බොහෝ ඈතට යනතෙක් ඇසෙයි. සිය පාක්ෂිකයන් මේච්චල් කරගන්නට තරම් ශක්තියක් නැති පියසෝම වැනි මන්ත්‍රිවරයකු ගැන රණසිංහ ගේ සිතේ ඇති වන්නේ උපහාසයකි.

"පියසෝම මහත්තයගෙ උපාසක පාට් මේවට හරියන්නේ නෑ.." අජිත් කියන්නේ රණසිංහට පමණක් ඇසෙන සේ ය. ".. ඇට්ටි හැලෙන්න රිටන් එක දුන්න නං ඔක්කොම හරි.."

දෙපාක්ෂිකයන් අතර ගැටුම ඇති වූයේ නොසිතූ මොහොතක ය. ඡන්ද පත්‍රිකා බෙදමින් ගෙන් ගෙට යමින් සිටි පියසෝම ගේ අනුගාමිකයන් හා විරුද්ධ පාක්ෂිකයන් අතර ඇතිවූ වචන හුවමාරුව ගුටිබැට හුවමාරුවක් දක්වා ඇවිල යන්නට ගතවූයේ ඉතා කෙටි කාලයකි. හිසට පොලු පහර වැදී තුවාල ලබා සිටි දෙදෙනකු තමන්ගේ වාහනයෙන් රෝහලට යවන්නට රණසිංහට ද සිදුවිය.

රෝහලේ සිට කිසිවකු දුරකතනයෙන් දන්වන තුරු ම දොස්තර වර්ජනය නිසාවෙන් රෝහල් වසා ඇති බවක් රණසිංහට සිහිපත් නොවී ය.

"මේ කාලකන්නි දොස්තරලා අදත් ස්ට්‍රයික්.. " මිදුලේ පාක්ෂිකයන් අතර සිටි පියසෝම සිය ජාතික ඇඳුමේ අත් දෙක කෙටි වන්නට නවා ගනිමින් පක්ෂ කාර්යාලයට ඇතුල්

අනෙක් පිටුවට